# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවය පිටු දැකීම කෙරෙහි ග්‍රාමීය කාන්තාවගේ ආර්ථික දායකත්වය

(වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

FACULTY OF GRADUATE STUDIES
06 AUG 2013
UNIVERSITY OF KELANIYA

සී.අයි. තුෂාරි

FGS/E/2001/305/R

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 839 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2011

# නිබන්ධ සාරාංශය

වර්තමාන ලෝක ආර්ථිකය තුළ කාන්තාවගේ දායකත්වය ඉමහත්ය. ගෝලීයකරණයත් සමඟ විශ්ව ගම්මානයක් බවට පත් වූ ලෝකයේ සෑම රටකම පාහේ ආර්ථික කටයුතු කෙරෙහි කාන්තාවගේ නැඹුරු වීම වර්ධනය වීමක් දක්නට ලැබේ. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල මෙහි වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබේ. ලෝකය ශීඝ්‍රයෙන් නවීකරණය වීමත් සමඟම මෙම රටවල ද ආර්ථික කටයුතු සඳහා ස්ත්‍රියගේ සාපේක්ෂ දායකත්වය ඉතා වැදගත් සාධකයක් බවට පත් විය. දරිද්‍රතාවය පිළිබඳ ගැටලු වලට මුහුණ දෙමින් සිටින ලාංකික සමාජයේ ද මෙම තත්ත්වය පැහැදිලිව දක්නට ලැබුණි.අතීත ශ්‍රී ලාංකික සමාජයේ ගතානුගතික අදහස වූයේ ස්ත්‍රිය රැකියාවක් නොකළ යුතු බවත් ඇයගේ කාර්යභාරය ගෘහණියක වශයෙන් කටයුතු කිරීම පමණක් බවත්ය. එසේ නමුදු කාලයත් සමඟ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟම සිදු වූ ක්ෂණික විපර්යාසයන් නිසා ආර්ථික රටාව විශාල වශයෙන් වෙනස් මුහුණු වරක් ගන්නා ලදි. ඒ අනුව සිදු වූ ආර්ථික කටයුතු වල ප්‍රසාරණයත් අනෙක් අතට සිදු වූ උද්ධමනාත්මක බලපෑම් හා ජීවන වියදම් ඉහළ යාමත් හේතු කොට ගෙන පවුලක පිරිමින් පමණක් රැකියා වෙළඳපළට ප්‍රවිශ්ට වීම ප්‍රමාණවත් නොවූ නිසා කාන්තාවන් ද ඒ කෙරෙහි යොමු වූ බවක් දක්නට ලැබේ. මේ හේතු කොට ගෙන ශ්‍රී ලාංකික කාන්තාව ද සේවා නියුක්ත අවස්ථා කෙරෙහි අවධානය යොමු කළ බව දක්නට ලැබේ.වර්තමානය වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ සංවර්ධන ක්‍රමෝපායන් තුළ ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත. ඒ යටතේ කාන්තාවට හා පිරිමින්ට තම ජීවිත ඔවුන් විසින් පාලනය කර ගැනීමේ හැකියාව ලබා දීමත් ඔවුනගේ ශක්තීන් හැකියාවන් හා වත්කම් වර්ධනය කර ගැනීමට අවස්ථාව ලබා දීමත් ඒ තුළින් දරිද්‍රතාවය පිටු දැකීම සඳහා ස්ත්‍රී පුරුෂ සමතාවය ඇති කිරීමත් ඒ අනුව ග්‍රාමීය කාන්තාවට ඔවුන්ගේ පවුල් මට්ටමේ කටයුතුවලදි දරිද්‍රතාවය පිටු දැකීම සම්බන්ධ ප්‍රතිපත්තියෙහි ප්‍රමුඛතාවය ලබා දී ඇත.ඒ අනුව ග්‍රාමීය කාන්තාව ක්‍රියාකාරී ලෙස ආර්ථික කාර්යයන්හි නිරත වෙමින් ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම සඳහා දායකත්වය ලබා දී තිබේ ද යන්න විමසා බැලීම වැදගත් වේ.

දී ලබා ගත් නියැදි දත්ත මත පදනම්ව ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවගෙන් වැඩි ලමාණයක් දරිද්‍රතාවයෙන් පෙළෙන ඒ සඳහා සිදු කල අධ්‍යයනයේ බව දක්නට ලැබුණි. සමස්ත කුටුම්බවල දැඩි විෂම ව්‍යාප්තියක් දක්නට ලැබුණ අතර අඩු ආදායම්ලාභීන්ගේ ප්‍රතිශතය වැඩිය.කුටුම්බ ඒකකයන්ගේ වියදම් රටාව දෙස බලන විට පාරිභෝජන ඉතා ඉහළ මට්ටමක පැවති අතර ඉතුරුම් මට්ටම අඩුය.ඒ අනුව ඔවුන් දරිද්‍රතාවයෙන් පෙළේ.. මෙම තත්වය මත සෑම පවුලකම දරිද්‍රතාවය පිටු දැකීමේ අරමුණින් කාන්තාව ආර්ථික කටයුතුවලට දායක වී ග්‍රාමීය දරිද්‍රතාවය පිටු දැකීම සඳහා ඉහළ ආර්ථික දායකත්වයක් ලබා දෙන බව නිගමනය කළ හැකිය.